GLOBAL SRI LANKAN FORUM
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
www.globalsrilankanforum.com
secretary@globalsrilankanforum.com

# පුවත්පත් නිවේදනයක්

## ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන්ගේ කාර්යාලය - අපේ ස්වයිරීත්වයට හා ජාතික ආරක්ෂාවට බලපෑම් ඇති කරවන තවත් 'ට්‍රෝජන් අශ්වයෙකි'

යහපාලන රජය විසින් ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන්ගේ කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා හඳුන්වා දෙන පනත අපගේ ස්වයිරීත්වය, භෞමික අඛණ්ඩතාවය හා ජාතික ආරක්ෂාව තව දුරටත් දියාරු කරවීමේ දරුණු උත්සාහයක් ලෙස ශ්‍රී ලංකා ගෝලීය සංසදය (GSLF) තරයේ විශ්වාස කරයි. මෙම භයානක පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී කඩිමුඩියේ හදිසියෙන්ම සම්මත කිරීමට යාමේදී අවිනීත ලෙස කෑ කෝ ගැසීම හා විවාදාත්මක පිළිතුරු යටපත් කිරීමට දරන උත්සාහයන් මධ්‍යයේ මෙහි කැඳවුම් කරුවන් කෙසේ හෝ මෙය සම්මත කර ගැනීම කිසිසේත්ම සුදුසු නැති බව හැඟේ.

මෙම භයානක පනත හරහා අතුරුදහන් වූවන් වාර්තා ගත කිරීමේ කාර්යාලයට ලැබීමට නියමිත වූ බලතල, නීතියට ඇති වන තර්ජන ගැන අවබෝධාත්මක ලෙස කරුණු දැක්වීමට අප රටේ නීතිය මෙන්ම ව්‍යවස්ථාව ගැනද හොඳ අවබෝධයකින් යුත් විශේෂඥයන් රැසක් අදහස් සම්භාරයක් ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා ගෝලීය සංසදය ද මෙසේ කරුණු ඉදිරිපත් කරයි.

- මෙම කාර්යාලයේ සේවක මණ්ඩලය ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු බව කියවෙන කිසිම සඳහනක් නොමැති වීම.
- විදේශීය පුද්ගලයින් හෝ සංවිධාන සමඟ යම් යම් එකඟතාවයන් ඇති කර ගැනීමට ඇති හැකියාව.
- යම් කිසි දේශීය හෝ ජාත්‍යන්තර මාධ්‍යයන් හරහා අරමුදල් රැස් කර ගැනීමට ඇති බලය.
- තොරතුරු ලබා ගැනීමේ අයිතියට අදාළ පනත මෙම කාර්යාලයට අදාළ නොවන සේ සකස් කර තිබීම.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය සිවිල් හෝ අපරාධ නඩු වලට නීත්‍යනුකූලව ඉදිරිපත් කළ නොහැකි ප්‍රකාශන හෝ ලියකියවිලි, අප රටේ සාක්ෂි ආඥා පනත පවා උල්ලංඝනය කරමින් කටයුතු කිරීමට ලැබෙන බලතල.
- වරෙන්තුවක් රහිතව ශ්‍රී ලංකාවේ ඕනෑම පොලිස් ස්ථානයකට, සිපිරි ගෙයකට හෝ ඕනෑම රජයේ ආයතනයකට ඇතුළු වී ඕනෑම ලිපි ලේඛනයක් පිටපත් කර ගැනීමට හෝ භාරයට ගැනීමේ බලතල.
- අතුරුදහන් වූවන්ගේ කාර්යාලය රහස්‍ය යයි සලකන ඕනෑම ලියවිල්ලක් ශ්‍රී ලංකා උසාවියකට ඉදිරිපත් නොකොට සිටීමේ බලතල.

- අභියාචනාධිකරණයකට ඇති ගාම්භීරත්වය කෙලෙසන අවස්ථාවක දී දිය හැකි නීත්‍යානුකූල දඬුවම්, අතුරුදහන් වූවන්ගේ කාර්යාලයට ද දිය හැකි වන සේ ඉහළ මට්ටමකට ගෙන ඒම.
- අප රටේ නීති පද්ධතිය යටතේ ඇති ඕනෑම සිවිල් හෝ අපරාධ උසාවියකට උත්තර දීමට සම්පූර්ණයෙන් මෙන් අවශ්‍ය නොවන සේ අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ නිලධාරීන්ට නියෝග දීම, තීරණ ගැනීම, ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ නොගැනීමට මෙම පනත තුළින් බලතල ලැබේ.
- අතුරුදහන් වී ඇතැයි සලකන පුද්ගලයෙක් සජීවීව සිටින බවට පැහැදිලි සාක්ෂි ලැබුන ද අදාළ පුද්ගලයාගේ අවසරයකින් තොරව ඔහු ජීවතුන් අතර සිටින බව සනාථ වුවත්, ඔහු අතුරුදහන් වී ඇතැයි පැමිණිලි කළ අයෙකුට හෝ අදාළ ඥාතියෙකුගෙන් අතුරුදහන්ව යැයි කියවෙන පුද්ගලයාගේ වන්හුන් වසන් කිරීමට ඇති හැකියාව.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීති පද්ධතිය මඟ හැර යාමට ඇති නීත්‍යානුකූල බලතල නිසා අප රටේ විරුද්ධ පක්ෂ දේශපාලඥයන්ට හෝ ආරක්ෂක සේවා හමුදා නිලධාරීන්ට හිරිහැර කිරීමට, අපරාධ චෝදනා ඉදිරිපත් කිරීමට හෝ සිර දඬුවම් පැනවීමට යම් යම් අය අතුරුදහන් වී ඇතැයි කියවෙන අසත්‍ය චෝදනා හරහා මෙවැනි කිසිම දාක නොදුටුවිරූ බලතල යොදා ගත හැක. ආරක්ෂක බුද්ධි අංශ වල සාමජිකයින් බලහත්කාරයෙන් රඳවා ගැනීමට, රජයේ ප්‍රතිපාදන හරහා දැනට පවතින සියුම් ක්‍රම වේදයන් මෙම අතුරුදහන් වූවන්ගේ කාර්යාලයට ද ඊට වඩා පහසුවෙන් නීත්‍යානුකූලවම යොදා ගත හැක. අතුරුදහන් වූවන්ගේ කාර්යාලය විසින් සොයා ගන්නා වූ තොරතුරු හා සාක්ෂි වලට අනුව ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට ශ්‍රී ලංකාවේ දී මෙන්ම ඕනෑම විදේශීය රටක උසාවියක දී වුවද නඩු විභාග පැවැත්වීමට හැකිව ඇත.

අතුරුදහන් වූවන්ගේ පනත සම්මත වීම ගැන ඒකීය හා ශක්තිමත් ශ්‍රී ලංකාවකට බොහෝ විට සම්ප්‍රදානුකූලව විරුද්ධ වූ විදේශීය රටවල් කීපයක් ද, දෙමළ කොටි ඩයස්පෝරාව, විදේශීය අරමුදල් වලින් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ බටහිර මාධ්‍ය වල සමහර කොටස් ද දැක් වූ සතුට හා ප්‍රසාදය නිසා අපගේ මේ ගැන තිබූ අදහස් හා මත සම්පූර්ණයෙන්ම සනාථ වී ඇත.

අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ ඇති විවෘතාන්ත ස්වභාවය නිසා හා අතුරුදහන් වූ අයගේ ඥාතීන්ට වන්දි ගෙවීමට ඇති අවශ්‍යතාවය නිසා එය පොදුවේ ශ්‍රී ලංකා රජයට දරාගත නොහැකි අති විශාල මූල්‍යමය බරක් වනු නිසැකය. දෙමළ කොටි සංවිධානයට සම්බන්ධ වී සිටි බොහෝ දෙමළ ත්‍රස්තවාදීන් ශ්‍රී ලංකාවෙන් පිට වී යාමට ව්‍යාජ හැඳුනුම්පත් හා නම් යොදාගෙන මෙන්ම විවිධ නීත්‍යානුකූල නොවන ක්‍රම සහ විධි උපයෝගී කරගෙන ඇති බැවින් ළඟදීම අතුරුදහන් වූ පුද්ගලයින්ගේ කාර්යාලට බෙදුම්වාදී දෙමළ දේශපලඥයින් හා විදේශීය දෙමළ කොටි ඩයස්පෝරාවයන්ගේ පූර්ණ අනුමැතිය හා සහයෝගය සහිතව ව්‍යාජ පැමිණිලි දහස් ගණනින් ලැබීම බලාපොරොත්තු විය හැක.

1980 වර්ෂය අග භාගයේ දී රාජ්‍ය පාලන තන්ත්‍රයේ සිටි අය හොඳින්ම දන්නා වූ සිය දහස් ගණන් වූ සිංහල යෞවන යෞවනියන්ගේ හදිසි අතුරුදහන් වීම් හා කොටියා සමග ගිවිසුම් ගසා ශ්‍රී ලංකා පොලිසියේ වීර නිලධාරීන් 700 කට පමණ කොටියාට යටත් වන්න යැයි කියා දුන් නිර්ලජ්ජිත නියෝගය හා එහි භයානක ප්‍රතිඵල ද හොඳින්ම අත්දුටු එකසත් ජාතික පක්ෂ මැති ඇමතිවරුන් විසින්ම අතුරුදහන් වූවන්ගේ අණ පනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මෙවැනි අතුරුදහන් වූ අයගේ නඩු හෝ එම සිදුවීම් ගැන කිසිවිටෙක වැදගත් ලෙස සොයා බැලීමක් කර නැත. මෑතකදී උතුරේ හා නැගෙනහිර දී අතුරුදහන් වූ අයට මුල් තැන දෙමින් සකසා ඇති මෙම අතුරුදහන් වූවන්ගේ පනත හරහා යම් කිසි යුක්තියක් හෝ සුභ සාධන කටයුත්තක් සිදුවේ යැයි දශක ගණනාවක්ම බලාපොරොත්තුවෙන් සිටි අයට මින් කිසිම සහනයක් ලැබේ යැයි සිතන්නටවත් නොහැක.

ඓතිහාසික ලෙස බලන කල්හි, අතුරුදහන් වූ අය ගැන සොයා බැලීම් ක්‍රියාත්මක වන්නේ ඒකාධිපති පාලනයක් හෝ ධනේශ්වර ෆැසිස්ට් වාදී දරදඬු පාලනයන්ගෙන් එම රටවල් අදාළ ජනතාව විසින් අවුරුදු ගණනාවක වද හිංසාවන්ගෙන් නිදහස් කර ගත්තායින් පසුවය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ රජය හා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) ඒකාබද්ධව ඉදිරිපත් කර ඇති මෙම පනතින් අපගේ විරෝදාර ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ නිලධාරීන්ට එරෙහිව යුධ අපරාධ කිරීමේ චෝදනාවන්ට ඉහත සඳහන් අයගේ උවමනා ඉෂ්ට කිරීම සඳහා මඟ පෑදීමට ඉඩ ඇත.

ශ්‍රී ලාංකික ජාති හිතෛෂී අයගෙන් ඉල්ලා සිටින්නේ ඔවුන් විසින් පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගන්නා ලද නියෝජිතයින්ට මෙම ඉතාමත් පිළිකුල් සහගත පනත වහාම ඉල්ලා අස් කර ගැනීමට හෝ අවලංගු කිරීමට වහ වහා උනන්දු වන්නැයි බල කිරීමයි.

ගෝලීය ශ්‍රී ලාංකික සංසදය සඳහා,
මාධ්‍ය ප්‍රකාශක,
රංජිත් සොයිසා.

**මෙම ආයාචනය සනාථ කෙරෙන අනිකුත් ගෝලීය සංවිධාන :**

- ශ්‍රී ලංකා - වික්ටෝරියා, සාමය, එකසත්කම හා මානව අයිතිවාසිකම් සඳහා වූ සංගමය.
- එක්සත් රාජධානියේ ශ්‍රී ලාංකික සහයෝගිතා ව්‍යාපාරය.
- නිව් සවුත් වේල්ස්හි ශ්‍රී ලාංකික සාමය, එකසත්කම හා මානව අයිතිවාසිකම් සඳහා වූ සංගමය.
- ජාතික නිදහස් පෙරමුණ - එක්සත් රාජධානි ශාඛාව.

- එක්සත් රාජධානියේ සිංහල සුභසාධන සංගමය.
- ශ්‍රී ලාංකික එකමුතුව - Ipswich
- විදේශගත ශ්‍රී ලාංකිකයෝ මව්බිම වෙනුවෙන්.
- ශ්‍රී ලංකාවේ සාමය, එකසත්කම හා මානව අයිතිවාසිකම් සඳහා වූ සංගමය.
- වික්ටෝරියාවේ විරු දරු අරමුදල.
- ශ්‍රී ලංකාවේ එකමුතුව සාමය හා පුනරුත්ථාපනය සඳහා වූ බටහිර ඕස්ට්‍රේලියානු සංගමය.
- ස්විස්ටර්ලන්තයේ ශ්‍රී ලංකා යුරෝපීය මිත්‍රතා සංගමය.
- මැද පෙරදිග ලංකා මිත්‍රතා සංගමය.